# ත්‍රී ස්ටාර් ෆාර්ම් නිෂ්පාදන සියයට සියයක්ම වස විසෙන් තොරයි

## - කලමනාකාර අධ්‍යක්ෂිකා ජානකී කත්‍රිආරච්චි



සේයාරුව - මහේෂ් ප්‍රියන්ත

**ORGANIC තත්ව සහතිකයෙන් පිදුම් ලැබූ වගයි**

දේශීය ආර්ථිකයට ශක්තියක් වන දේශිය ව්‍යාපාරිකයන් සොයා යන ගමනේ දී අපිට තවත් එක් විශිෂ්ටතම ව්‍යාපාරික කාන්තාවක් මුණ ගැහුණා. නමින් ජානකී කත්‍රිආරච්චි වන ඇය **Three Star Farm (Pvt) Ltd** හි කළමනාකාර අධ්‍යක්ෂවරියයි.

මේ ඇය සමග කළ කෙටි සංවාදයකි.

■ ත්‍රී ස්ටාර් ෆාර්ම් (පෞද්) සමාගම පිළිබඳ හැඳින්වීමක් කළොත්?

ත්‍රී ස්ටාර් ෆාර්ම් (පෞද්) සමාගම පිහිටා තිබෙන්නේ පිළියන්දල ප්‍රදේශයේ. 1992 වර්ෂයේ තමයි අපි මේ ආයතනය ආරම්භ කළේ. අපි කරන්නේ Organic Farm එකක්.

නෙදර්ලන්තයේ Central Union Certification (Skill International) ආයතනයෙන් Organic සහතිකය ලබා තිබෙනවා. ලෝකයෙන් ම මෙසේ සහතික කළ එකම පලා ගොවිපොළ මෙයයි.

■ මෙම Organic සහතිකය ලැබීමේ විශේෂත්වය කුමක් ද?

කිසි ම කෘෂි රසායනික ද්‍රව්‍යයක්, කෘමිනාශක වර්ගයක් භාවිත නොකර වගා කිරීම සඳහායි මෙම සහතිකය ලැබෙන්නෙ. රසායනික ද්‍රව්‍ය භාවිත නොකර 100%ක්ම ස්වභාවික පොහොර පමණක් භාවිත කර පවත්වාගෙන යන ගොවිපොළක් තමයි අපිට තිබෙන්නෙ. ඒ නිසා 100%ක්ම වසවිස නැති ස්වභාවික නිෂ්පාදනයක් වෙළෙඳපොළට නිකුත් කිරීමේ හැකියාව අපට තිබෙනවා.

■ ඔබේ ආයතනයේ නිෂ්පාදනය කරන්නේ මොනවා ද?

ප්‍රධාන වශයෙන් ඉතා ඉක්මනින් ආහාරයට පිළියෙල කරගත හැකි පලා මැල්ලුම් අපි වෙළෙඳපොළට නිකුත් කරනවා. ඉතාමත් සෞඛ්‍යාරක්ෂිත ලෙස සකස් කරන මේවා සෝදා කපා මැල්ලුමක් ලෙසම ඇසුරුම් කර තිබීමයි විශේෂත්වය. මීට අමතරව මේ සමානවම ස්වාභාවිකව හා සෞඛ්‍යාරක්ෂිතව නිපදවන කොළ කැඳ, එළවළු සුප්, ෆෘට් ජූස් ද අපේ නිෂ්පාදන අතර තිබෙනවා.

■ මේ නිෂ්පාදන මිලදී ගත හැක්කේ කුමන වෙළෙඳසල්වලින් ද?

දැනට බස්නාහිර පළාතේ කාර්ගිල්ස්, කීල්ස්, ආර්පිකෝ හා ලාෆ්ස් යන සුපිරි වෙළෙඳසල්වලින් මිල දී ගත හැකියි. ඉදිරියේ දී කාර්ගිල්ස් බෙදාහැරීම් ජාලය හරහා ලංකාව පුරා ම ව්‍යාප්ත කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේ ම 2010 වර්ෂයේ දී කොළ කැඳ Stole ප්‍රමාණය ව්‍යාප්ත කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ජනවාරි මාසයේ දී එච්.එස්.බී.සී රාජගිරිය ප්‍රධාන කාර්යාලය තුළ අපි අලුතින් ම කොළකැඳ Stole එකක් පටන් ගන්නවා. ඉන්පසු සුපිරි වෙළෙඳ සල් ආයතනය හා වෙනත් ප්‍රසිද්ධ ස්ථානවලටත් අපි මෙය ව්‍යාප්ත කරනවා. එවිට ස්වාභාවික සෞඛ්‍යාරක්ෂිත, කොළ කැඳ, එළවළු සුප් සහ නැවුම් පලතුරු බීම ඉතා අඩු මිලකට ඔබට ලබාගත හැකි වේවි.

■ මෙතෙක් ඔබ ආ ගමන් මගේ ඇගයීමට ලක් වූ අවස්ථා පිළිබඳ සඳහන් කළොත්?

2005 වර්ෂයේ දී කාන්තා වාණිජ මණ්ඩලයෙන් විශිෂ්ටතම ව්‍යාපාරික කාන්තාවට පිරිනමන සම්මානයත් 2007 වර්ෂයේ FCCISL Awards බස්නාහිර පළාතේ ලෝකඩ සම්මානය හා ජාතික මට්ටමේ කුසලතා සම්මානයත් 2008 වර්ෂයේ ජාතික මට්ටමේ ලෝකඩ සම්මානයත් හිමි වුණා. ඒ වගේ ම ශිල්ප 2008 බස්නාහිර පළාත් පළමුවැනි ස්ථානය හා සමස්ත ලංකා දෙවන ස්ථානයත් 2009 - බස්නාහිර පළමු වැනි ස්ථානයත් හිමිකර ගැනීමට අපට හැකි වුණා. ඒ වගේ ම අපේ ආයතනයට සූර්ය සිංහ ලාංඡනයද හිමිව තිබෙනවා.

■ ඔබේ නිෂ්පාදනවල තත්වය පිළිබඳව ඔබට පැවැසිය හැක්කේ කුමක් ද?

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් පිරිනමන GMP සහතිකය ලත් ලංකාවේ පළමුවැනි ආයතනය අපේ ආයතනයයි. ඒ වගේ ම 100%ක් ස්වාභාවික බව ඔප්පු කිරීමට අපිට Organic සහතිකය ලැබී තිබෙනවා.

■ මේ ගමනේ දී ඔබට අතහිත දුන් අය ඉන්නවා ද?

උදව් කළ අය හරි අඩුයි. ඉදිරියට යන විට කකුලෙන් ඇදපු අය තමයි වැඩිපුර හිටියෙ. නමුත් මගේ පවුලේ අය මගේ මහත්තයා වගේ ම DFCC බැංකුව හා කොමර්ෂල් බැංකුවත් මට උදව් කළා.

■ ඔබේ ඉදිරි බලාපොරොත්තු මොනවා ද?

දැනට බස්නාහිර පළාතට සීමා වූ මේ ව්‍යාපාරය ලංකාව පුරාම ව්‍යාප්ත කිරීමයි මගේ එකම අරමුණ. දැනට 35කට පමණ රැකියා අවස්ථා සලසන්නට හැකි වූ මට එවිට තව 200කට 300කට පමණ රැකියා ලබාදෙන්නත් පෝෂණයෙන් අනූන ස්වාභාවික ආහාර ජනතාවට ලබාදෙන්නත් හැකි වේවි.

සංවාද සටහන
**විශාකා අබේරත්න**